


සිසිර දිසානායක

කිතුලක් හොයාගෙන යන්නට පාරට බැස්ස පන්හිඳටයි, පින්සලටයි එදා මුහුණ දෙන්න වුණේ හරිම අකරතැබ්බයකට. දෙන්නාටම හොඳ හොඳ සිංහල වචන සිහිවෙන්නෙ තෙලිජ්ජ ටිකකින්වත් තොලකට තෙමාගත්තොත් තමයි. මෙල්බර්න් නගරයේ කොහෙන්ද කිතුල් රා හොයන්නෙ. ගොම්මන අහවර වෙන්ට කලියෙන් දෙන්නා රිංගාගත්තා ළඟම තිබුණ තැබෑරුමකට.
පාවිච්චි කළ දේවල්වල වරදක්ද මන් දන්නෙ නෑ. ටික ටික පදම් වෙන කොට පන්හිඳට වචන පටලැවෙන්න, මාරුවන්න පටන් ගත්තා.

''තුඩට එන්නෙම අමු හිංගල...'' පන් තතන තතනා කිව්වා.
''ඒත් එක්තරා විදියක බස් වහරක් තමා'' පින්සලටත් ටිකක් වචන පැටලුණා.
''මොකද වචන ටැපලෙන්නෙ? රතු ඉරි පැනලා වගෙයි...'' පන්ට හිනා.

''ටැපලෙනවා කියන යෙදුම අපේ වහරට අලුතින් එක් වුණ වචනයක්'' ටිකක් වැඩි වුණාම මව් බස සිත්ගේ මාතෘකාව වෙන්නෙ මව් බස.
''ඒකත් හරියට කලුවරට කරුවල කිව්වා වාගෙයි''
''දන්නවද ඔය අකුරු මාරුවට කියන්නෙ මොකක්ද කියාල?'' පන් පණ්ඩිත ස්වරයෙන් ඇහුවා.

''මොකද ළඟකදි ධර්මබන්දු මහත්තයාවවත් මුණ ගැහුණද?'' පින් දන්නවා පන් පණ්ඩිතකම් ආරෝපණය කරගන්නෙ කොයි කොයි තැන්වලින්ද කියලා.
''උන්නැහේ තමයි කිව්වේ... ඕකට කියන්නෙ වන පෙරළිය කියලා. සිංහල භාෂාවේ යෙදෙන පෙරළි පහෙන් එකක් ඔය. අපි වාගේ අවසේස උදවියට වැටහෙන තවත් එක පෙරළියක් තමයි පද පෙරළිය 'එළ ලූ තල' කියන වචන පෙළ, තලඑළලු කියන තනි වචනයට පෙරළෙනවා රන් මසු කිව්වොත් වචන දෙකක්. ඒත් ඒ තේරුමෙන්ම මසුරන් කියන වචනයට පදය පෙරළෙනවා.''

''පන්... ඕවා ගැන පන් ලියන්න ගත්තොත් ධර්මබන්ධු, ජේ.බී. දිසානායක වගේ මහත්තුරුන්ට ලියන්න දේවල් නැතිව යනවා. අපි අළුත් දෙයක් ගැන බලමු''
''අළුත් දෙයක් නේද?'' පන් කල්පනාවට වැටුණා.
''ජහමනයට තේරෙන්ටත් එපායැ'' පන්ට ඉබේම කියවුණේ අකුරු ටැපලිලා.
''ඔය තියෙන්නෙ.... ඔය ගැන ලියමු'' පින් සතුටින් මුරගෑවා.

''මොනවා කියලද ඒවාට කියන්නෙ?'' පන්ට ප්‍රශ්නයක්.
''නමක් යෝජනා කරන්නට අපි මේ දේවල් කියවන අයට බාර දෙමු''
''හොඳා එහෙනම්... ලියමු'' පන් තලය ටිකක් කොළයේ එක පැත්තක අතුල්ලලා එහෙම හරිබරි ගැහුණා.

නිශ්චිත නමකින් මෙතෙක් හැඳින් වී නොතිබුණද, සිංහල බස් වහරේ අපූරුතම අංගයකි වචනයක අකුරු හෝ වචන දෙකක මුලකුරු මාරු කොට කියවීම. හෙළ බසේ තේරවිළි නමින් වන ආකර්ශණීය අංගයේ ප්‍රාථමික අවධිය. මේ යැයි අපගේ අනුමානයකි. ''තේරවිලි'' වෙනත් භාෂාවන්හිද දක්නට ලැබෙන විශේෂාංගයක් වුවද ඉහත කී අක්‍ෂර හරඹය සිංහලයට විශේෂිත වූවකැයි සිතිය හැකිය. පෙර කියැවුණා සේ 'මහජනයා' වදන 'ජහමනයා' ලෙසින්ම 'ම' සහ 'ජ' මාරු කොට කියවා එහි නියම වචනය ඇසීමෙන් කුඩා ළමයාගේ පටන් වැඩිහිටි මහළු අය දක්වා සෑම සියලු දෙනාම එකසේ ලබන්නේ විනෝදයකි. ''මහජනයා'' යන්න තනි

## අකුරු පෙරළිය?

වදනක් වුව එහි මූලික රූප දෙක වෙන්ව හඳුනා ඒවායේ මුලකුරු පටලවන්නටත් ඒ පටලැවිලි විසඳන්නටත් නූගත් ගැමි දරුවකු පවා පානා හපන්කම විශ්මයජනක නොවේද? අප බස් වහර උපතින්ම අපගේ මුඛ කුහරයේ ලැගුම් ගත් අන්දමයි ඒ. මෙවන් වදන් පෙළක් පහත පෙළගන්වන්නේ එහි අපූර්වත්වය විඳීම සඳහායි. පාඨකයාට නිවැරදි වදන් තෝරා බේරා ගැනීමට ඉඩ සැළසීම වඩාත් අගනේ යැයි සිතේ.

| | | |
|---|---|---|
| ගට්ටපෙම | මණ බඩුව | අරණපරක්කු |
| ගැටකස්ම | කක්වඩය | පොහිවැද |
| පැලුකොටියා | තිස්කරම | ගරිස් මිල |
| ලොල්කිටය | කළල් බණ | කුක්කට්ටා |
| ඇත්බටය | කුන්දඩය | හැත්බලිය |
| මැලාකදිරියා | බරිකිත් | කොන්ද කැලේ |
| හළඑරකා | පැදෝකණිය | කල්පොට්ට |
| තෙල්පොල් | පටිඉන්දම | හතුකුලය |
| ගෙළකඩිය | පිරකංචා | කුට්ටඇනා |
| නකහිලා | මරහිණය | කම්බලඋඩ |
| සැටඇකිල්ල | ගෙංදඩිය | ගෙංවඩිය |
| කච්චිකොරල | පෙල් අනෙත්ත | කරිත්තිලය |
| මත්තකොල්ලි | තත්බිරය | |

බොහෝ විට මෙවන් අක්‍ෂර පෙරළි නිමැවුම් කරුවන්ගේ අවධානයට ලක්වී ඇත්තේ මාත්‍රා හතර,



පහ සහ හය බැගින් යෙදුණු වදන් වගට ඉහත වදන් නිදසුන් දේ. 'ගට්ටපෙම' වචනයේ තුන් වැනි අක්‍ෂරය මුල් ස්ථානය ගන්නා අතර 'කල්පොට්ටෙ'හි මාරු වන්නේ දෙවැන්නයි. 'කම්බලඋඩ' හි සිව් වැන්නයි.
ඉහත නිදසුන් සලකා බැලීමේදී පෙනීයන්නේ මෙම වදන් ක්‍රීඩා අද ඊයේක පටන් ගැනුනක් නොවන වගයි. එසේ වුවද 'ජහමනයා' මෑත කාලීනව පුවත්පත් මාධ්‍යයේ කාටූන් චිත්‍ර ඇසුරින් පිළිපැන්නෙකැයි හුවා දැක්විය හැකියි.

වෙනත් ලිපියකින් අවතීර්ණ විය යුතුව ඇති මාතෘකාවකි. ''තේරවිළි'' තේරවිළිවල ඉතා රසවත් අංගයක් වන තුන් තේරවිළි සඳහා මුල පුරන්නේ මෙම අක්‍ෂර මාරුවයි. ඊට කදිම නිදසුනකි 'වල් පොත්ත'. ඒ හෙළිදරව්කරවා ගැනීම සඳහා යොමු කෙරෙන වදන නම් 'කැලෑ සිවිය' යි.
කැලෑ නම් - වල්
සිවිය නම් - පොත්ත
'වල්පොත්ත'
'පොල්වත්ත' යි පිළිතුර.

එය ගණිත සමීකරණයක් සේ ය අපට දැනෙනුයේ. සැබැවින්ම මේ වදන් සමීකරණයක් නොවේද?

සිංහල භාෂාවේ මෙවන් ආකර්ෂනීය අංග අපගේ ගේය පද රචකයින්ද පරිහරණයට ගත් අවස්ථා ගී වංශ කතාවේ ලියැවේ. ප්‍රේමකීර්තිද අල්විස් ශූරීන් විසින් රචිත, ''සඳට අහස ආදරේදෝ'' (සංගීතය සහ ගායන ශිල්පී වික්ටර් රත්නායක ශිල්පිනී සුජාතා අත්තනායක සමඟ) ගීයේ අවසන් පද මෙසේ ලියැවී ඇත්තේය.

පෙම්වතා : එහෙනම් මම මුමුණන පද මේ ගී පද
යළි පෙරළා කියනවදෝ
පෙම්වතිය : හ්ම්... හ්ම්...
පෙම්වතා : පදමවනයි
පෙම්වතිය : මඳපවනයි
පෙම්වතා : පඳ සහනයි
පෙම්වතිය : සඳ පහනයි
පෙම්වතා : වසර සසන තුරු
පෙම්වතිය : සසර වසන තුරු
පෙම්වතා : අම මාදරෙයි
පෙම්වතිය : මම ආදරෙයි.

ජයතිස්ස බොරළුගොඩ රචකයාණන් පබඳින ලදුව ලයනල් රන්වල ශූරීන් ගැයී ''මේ අවුරුදු කාලේ'' ගීයේ ''මැංගිරි ඩිණිකෝ'' වශයෙන් ලියැවුනේ ''ඩිංගිරි මැණිකා පිළිබඳව බව නොවැටහුණ රසිකයෙකු අත්දැයි සිතිය නොහැකිය. යුගයෙන් යුගයට කෙරෙන නිර්මාණ කාර්යාවලියේදී නිර්මාණකරුවකුගේ යුතුකම වනුයේ අපගේ උරුමයේ සැඟවී ගැබ්වී ඇති මෙවන් සුන්දරාත්මක වූත්, කාහටත් රසවිඳිය හැකි සේ සරළ වූත් අංගයක් ඉස්මතු කරමින් නිර්මාණයක් කිරීමයයි අපගේ හැඟීමයි. ඉහත පද නිදසුන් මතු නොව තව තවත් බොහෝ දෑ පූර්වාදර්ශකොට ගනිමින් ඊටත් වඩා නැවුම් යමක් ඉදිරිපත් කිරීමයි හපන්කම. ඊට ගැරහීම හෝ අවතක්සේරු කිරීම නොවේ.

''මම මොනවද අඳින්නෙ?'' පින්සල අසරණ වෙලා වගේ ඇහුවා.
''තමන් කරපු දෙයක්වත් ලිව්වානම් අනුන්ට බණ කිය කියා ඉන්නෙ නැතිව. වැදි බණවලින් පක් තියෙනවද?'' පින් නෝක්කාඩුව සම්පූර්ණ කළේ වේදනාවකින්.

''ඒකත් එහෙමයි නේද? එහෙමනම් සරුවට ලියවුණ දෙයක් නොවුණත් මේ පද පෙළවත් ලියාතබන්නට තරහ අවසර ආයුබෝවන්...''

පෙම්වතිය :තුන් තේරවිළි කියන්ට නම් එපා
හිතුවාද තෝරාගන්ට බෑ කියා

පෙම්වතා :තුන් තේරවිල්ල, මට නුඹයි සදා
හිතුවාට තෝරගන්ට බෑ මෙයා

පෙම්වතිය :පද පෙරළ පෙරළ දොඩනවද මුසා
හිතුවැකි එන්නෙ මොනවටද කියා

පෙම්වතා :තොල් පෙරළ පෙරළ කියන ඔය කතා
හිත ගාව මාගෙ මායමක් වෙලා

පෙම්වතා :පද තේරිලා ද පෑවේ මල් හිනා
''අට මාදරේ ඳ' කෝල නංගියා?

පෙම්වතිය :පද තේරුණාය කීව පෙරළිලා
''අත හීදරෙන්ම' කෝළමක් වුණා

පෙම්වතා : මට ආදරේද කෝල නංගියා?
පෙම්වතිය : හිත ආදරෙන්ම කෝලමක් වුණා...

■



[illegible]